**ජාතික විද්‍යා පදනමේ විද්‍යා හා තාක්ෂණ ග්‍රන්ථ ප්‍රකාශන ප්‍රවර්ධනය සඳහා වන යෝජනා ක්‍රමය - නිර්ණායක මාලාව**

**අරමුණු**

1. විද්‍යා හා තාක්ෂණ ග්‍රන්ථ කතුවරුන්ට විද්‍යා හා තාක්ෂණ කෙෂ්ත්‍රයට අදාළ ඔවුන්ගේ ප්‍රකාශන වල ඇති වැදගත්කම අනුව ග්‍රන්ථ ප්‍රකාශන සඳහා මූල්‍යාධාර ලබා දීම.

2. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පෘථුල පරාසයක් ආවරණය වන පරිදි විවිධ මාතෘකා ඔස්සේ ග්‍රන්ථ රචනයට කතුවරුන් උනන්දු කරවීම.

3. දේශීය අවශ්‍යතා වලට සරිලන පරිදි විද්‍යා තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ වන මුද්‍රිත හා ඉ-ග්‍රන්ථ වල සුලබතාවය වැඩි කිරීම.

**මෙම යෝජනාක්‍රමය යටතේ සලකා බැලෙන ප්‍රකාශන සඳහා වන නිර්ණායක**

පහත සඳහන් ප්‍රකාශන, මෙම යෝජනා ක්‍රමය ප්‍රදානය කිරීමේදී සලකා බලනු ලබයි.

1. කාලීන වැදගත්කමකින් යුතු විද්‍යාත්මක මාතෘකා අළලා සැකසූ ග්‍රන්ථ/විචාර ග්‍රන්ථ (විමර්ශන ග්‍රන්ථ).

2. පාසල් විෂය නිර්දේශය පාදක කරගනිමින් සැකසූ පෙළ පොත්/සහ පරිපූරක කියවීමේ ග්‍රන්ථ.

3. අත්පොත්/මාර්ගෝපදේශ පොත්/පිරික්සුම් ලැයිස්තු

4. අධ්‍යාපනඥයන් සහ විද්‍යාඥයින් උදෙසා වන උපකාරක ග්‍රන්ථ

5. සරල විද්‍යාත්මක සංකල්ප අවබෝධයට උපකාරී වන විද්‍යා ක්‍රියාකාරකම් අඩංගු වන ග්‍රන්ථ

6. අනාගත විද්‍යාත්මක ලෝකයේ පුරෝකථන අලලා රචනා වූ විද්‍යා ප්‍රබන්ධ

**ක්‍රියාවලිය**

1. රචකයින් පහත සඳහන් ලියකියවිලි සමඟ අයදුම් පතක් විද්‍යා හා තාක්ෂණ ග්‍රන්ථ ප්‍රකාශන ප්‍රවර්ධනය සඳහා වන යෝජනා ක්‍රමය සඳහා යොමු කල යුතුය.

- ග්‍රන්ථයෙහි අත්පිටපතක්
- දළ වියදම දැක්වෙන අය වැය ලේඛනයක්
- මුද්‍රණාල 03කින් ලබා ගත් මිළ කැඳවුම් 03ක්

1. ප්‍රකාශනයෙහි අඩංගු විද්‍යාත්මක කරුණු වල වලංගුභාවය සහ අදාළ පාඨක සමූහයට ග්‍රන්ථයෙහි ඇති වැදගත්කම තහවුරු කර ගැනීමට ජාතික විද්‍යා පදනම මඟින් හඳුනාගත් අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් 02කු වෙත මෙම ග්‍රන්ථ, විචාරය පිණිස යොමු කෙරේ.

2. ග්‍රන්ථ විචාරයෙන් පසු අදාළ විචාරකවරුන් විසින් නිර්දේශ කරනු ලබන යෝජනා/වෙනස්කම් ග්‍රන්ථ රචකයා විසින් ග්‍රන්ථයෙහි අඩංගු කල යුතු වේ.

3. තෝරාගත් අත්පිටපත් සඳහා මුද්‍රණ සහ ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා අදාළ වන බරපැන ජාතික විද්‍යා පදනම විසින් දරනු ලබයි.

4. ඉහත කී යෝජනාක්‍රමය මගින් ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා වන පහත දක්වා ඇති සියලු ක්‍රියාවලි වලට අදාළ වියදම ආවරණය කරනු ලබයි.

- යතුරු ලියනය
- පිටු සැකසුම හා පිටු නිර්මාණකරණය
- සංස්කරණය
- සෝදු පත් බැලීම
- මුද්‍රණ සඳහා වන පිටපත සැකසීම
- මුද්‍රණය

5. මුද්‍රණය කල යුතු පිටපත් සංඛ්‍යාව, අදාළ ග්‍රන්ථය සඳහා වන පාඨක සමූහය මත තීරණය වේ. කතුවරයා විසින් මුද්‍රණය කළ යුතු පිටපත් සංඛ්‍යාව තීරණය කළ යුතු අතර ඒ පිළිබඳව වන අවසන් තීරණය ජාතික විද්‍යා පදනම සතු වේ.

6. ග්‍රන්ථ මුද්‍රණය සහ ප්‍රකාශනය සඳහා වන නිර්ණායක/පිරිවිතර තීරණය කිරීමට කතුවරයාට බලතල හිමිවේ.

7. ග්‍රන්ථයේ උපරිම මිල එහි එක් පිටපතක් ප්‍රකාශනය සඳහා වන වියදම මෙන් 1.5ක ප්‍රමාණය නොඉක්මවිය යුතුය.

8. ග්‍රන්ථ අලෙවිය සහ බෙදාහැරීම පිළිබඳව වගකීම දැරිය යුත්තේ කතුවරයා වන අතර වසරකට වරක් ග්‍රන්ථයේ අලෙවිය සහ බෙදා හැරීම පිළිබඳව වාර්තාවක් ජාතික විද්‍යා පදනම වෙත ඉදිරිපත් කළ යුතුය.

9. කතුවරයාගේ අභිමතය පරිදි ජාතික විද්‍යා පදනමේ නිල වෙබ් අඩවිය ඔස්සේ ග්‍රන්ථයේ ඉලෙක්ට්‍රොනික පිටපතක් විකාශනය කල හැකිය. එය ග්‍රන්ථ ප්‍රකාශනය වඩාත් පුළුල් පාඨක සමූහයක් වෙත ළඟා කර දීමට උපකාරී වේ.

10. මෙම ප්‍රතිපාදන ක්‍රමයට විද්‍යාඥයින්, ගුරුවරුන් ඇතුලු විද්‍යා ග්‍රන්ථකරණයේ යෙදෙන කතුවරුන්ට අයදුම් කල හැකිවේ.

11. සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන ඕනෑම භාෂා 03ක් ඔස්සේ අත්පිටපත් භාර ගනු ලැබේ. සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගත් ප්‍රකාශන සඳහා සිංහල, දෙමළ යන භාෂා වඩාත් යෝග්‍ය වේ.

12. සියලුම ප්‍රකාශන අයිතිය කතුවරයා සතු වේ.

13. ජාතික විද්‍යා පදනමේ නිල ලාංජනය ග්‍රන්ථයේ සුදුසු තැනක පැහැදිලිව පෙනෙන ස්ථානයක අඩංගු කල යුතු වේ. එසේම ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා ජාතික විද්‍යා පදනම විසින් දැක්වූ දායකත්වය ග්‍රන්ථයේ වෙනම පිටුවක පහත දැක්වෙන වගන්තිය ඔස්සේ සඳහන් කළ යුතුය. "මෙම ග්‍රන්ථය ප්‍රකාශනය සඳහා ජාතික විද්‍යා පදනම පූර්ණ අනුග්‍රාහකත්වය දක්වා ඇත."

14. "ග්‍රන්ථයේ අඩංගු වන අන්තර්ගතය පිළිබඳව ජාතික විද්‍යා පදනම විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ." යන වගන්තිය සියලුම ලියකියවිලි වල අඩංගු කල යුතුය.

15. ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා ජාතික විද්‍යා පදනමේ අනුමැතිය ලැබුණ පසුව ඉහත විස්තර කල කරුණු සියල්ල ආවරණය කරමින් ගිවිසුමක් අත්සන් කල යුතුය. පළමු අදියරේදී අනුමත වූ මුදලින් 90% ක් ප්‍රදානය කරනු ලබයි. ඉතිරි 10% ක ප්‍රමාණය ග්‍රන්ථය ප්‍රකාශයට පත් වූ පසුව ලබාදේ.

16. ග්‍රන්ථ ප්‍රකාශනය සඳහා ප්‍රදානය කරනු ලබන මුදල කතුවරයා විසින් ලබා දෙන වැය ලේඛණය පාදක කරගනිමින් ජාතික විද්‍යා පදනම මගින් තීරණය කරනු ලබයි. ලබා දෙන උපරිම මුදල රුපියල් ලක්ෂ 5ක උපරිමයකට යටත් වේ. කතුවරයා විසින් ග්‍රන්ථ ප්‍රකාශනයේ පිටපත් 30ක් ජාතික විද්‍යා පදනමේ බෙදාහැරීමට සහ ජාතික විද්‍යා පදනමේ පුස්තකාලය වෙත ලබා දිය යුතුය.